සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 12 - 2023

විභාග අංකය: ....

ආර්ථික විද්‍යාව – I

කාලය පැය 02 යි

උපදෙස්:-

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා උත්තර පත්‍රයේ නියමිත පරිදි කතිරයක් (×) යොදා දක්වන්න.

---

(01) සාර්ව ආර්ථික විද්‍යාවට අයත් යථානුරූපී ප්‍රකාශයකි.

(1) වර්තමානයේ ශ්‍රී ලංකා ආර්ථිකය තුළ නිරුද්ධමන තත්වයක් පවතී.

(2) සේවා වියුක්තිය අවම කිරීම සඳහා විදේශ සේවා නියුක්තිය ශක්තිමත් කළ යුතුය.

(3) විදුලි ගාස්තු අවම කිරීම තුළින් ජීවන වියදම අඩු කර ගත හැකිය.

(4) වෙළඳ ශේෂයේ අහිතකර බලපෑම අවම කරනු පිණිස මෝටර් රථ ආනයනය අත් හිටුවීම කාලෝචිත වේ.

(5) සාධාරණ ආදායම් පුනර් ව්‍යාප්තියක් සඳහා 'අස්වැසුම' වැඩ සටහන ඉවහල් වේ.

(02) එක්සත්කම ගොඩනැංවීම තුළින්, ශුභසාධනය ඉහළ නංවා ගනිමින් ආර්ථික වෘද්ධිය හා තිරසාර සංවර්ධනය ළඟා කර ගැනීමට අවශ්‍ය තීරණාත්මක සාධකයක් වන්නේ,

(1) කාරක ප්‍රාග්ධනය යි. (2) සමාජ ප්‍රාග්ධනය යි. (3) මානව ප්‍රාග්ධනය

(4) භෞතික ප්‍රාග්ධනය යි. (5) ස්වභාවික ප්‍රාග්ධනය යි.

(03) පහත සඳහන් ස්වභාවික සම්පත් අතරින් ප්‍රතිෂ්ඨාපනය කළ හැකි සම්පතක් වන්නේ,

(1) ස්වභාවික ගෑස්. (2) ගල් අඟුරු (3) සාගර මත්ස්‍ය සම්පත

(4) ඛනිජ තෙල් (5) යපස්

(04) සමාජ ආරක්ෂණ ජාලයක් සපයමින් මහජන ශුභ සාධනය සඳහා වැඩි ඉඩකඩක් වෙන් කරමින් වෙළඳපොළ යාන්ත්‍රණය මත මූලික ආර්ථික ප්‍රශ්න විසඳන ආර්ථික පද්ධතියකි.

(1) සැලසුම්ගත ආර්ථික පද්ධතිය. (2) සාම්ප්‍රදායික ආර්ථික පද්ධතිය.

(3) වෙළඳපොළ ආර්ථික පද්ධතිය. (4) සමාජීය වෙළඳපොළ ආර්ථික පද්ධතිය.

(5) සමාජවාදී වෙළඳපොළ ආර්ථික පද්ධතිය.

(05) භාණ්ඩයක මිල එහි ආන්තික පිරිවැයට සමාන වන විට, $(P = MC = MB)$ ආර්ථිකයක් අත්කර ගන්නේ,

(1) පූර්ණ නිෂ්පාදනය යි.

(2) පූර්ණ සේවා නියුක්තිය යි.

(3) ආර්ථික වර්ධනය යි.

(4) සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාවය යි.

(5) වෙළඳපොළ සමතුලිතතාවයි.

(06) නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදා ගන්නා සම්පත් වල පවත්නා සුවිශේෂීභාවය නිසා,

(1) ස්ථාවර ආවස්ථික පිරිවැය හටගනී. (2) වැඩෙන ආවස්ථික පිරිවැය හටගනී.

(3) පරිමාණානුකූල පිරිමැසුම් හටගනී. (4) අඩු වන ආවස්ථික පිරිවැයක් හටගනී.

(5) ආවස්ථික පිරිවැය ශුන්‍ය අගයක් ගනී.

(07) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් වමට විතැන් වීමට බලපාන හේතුවක් **නොවන්නේ,**

(1) තාක්ෂණය බිඳ වැටීමක්.

(2) නියගය නිසා සම්පත් විනාශ වීමක්.

(3) ජනවාර්ගික වශයෙන් වෙනස්කොට සැලකීමක්.

(4) ආනයනික අමුද්‍රව්‍ය සඳහා ආර්ථික සම්බාධක පැනවීමක්.

(5) ශ්‍රම ඵලදායීතාවයේ අඩු වීමක්.

(08)



ඉහත නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ නිෂ්පාදන ස්ථානය A සිට B දක්වා ගමන් කිරීමට හේතු වන සාධකය වන්නේ,

(1) තාක්ෂණික බිඳ වැටීමකි. (2) ඵලදායීතාව පහළ යාමකි.

(3) සේවා නියුක්තිය වර්ධනය විමකි. (4) සේවා වියුක්තිය ඉහළ යාමකි.

(5) භාණ්ඩ දෙක සඳහා සම්පත් කාර්යක්ෂමව බෙදා හැරීමකි.

(09) ඉල්ලුම් නීතිය ගොඩනැගීමේ දී යොදා ගත් උපකල්පනයක් **නොවන්නේ,**

(1) නිශ්චිත අවස්ථාවක මිල සහ ඉල්ලුම් ප්‍රමාණය සැලකිල්ලට ගැනීම.

(2) මිල හැර ඉල්ලුමට බලපාන අනෙකුත් සාධක නොවෙනස්ව පැවතීම.

(3) සාමාන්‍ය භාණ්ඩයක ඉල්ලුම සැලකිල්ලට ගැනීම.

(4) මිල සහ ඉල්ලුම් ප්‍රමාණය අතර ප්‍රතිලෝම සම්බන්ධයක් පැවතීම.

(5) තාර්කික ගැනුම්කරුවකුගේ හැසිරීම් සැලකිල්ලටම ගැනීම.

(10) මිල පහළ යාමක ආදේශන ප්‍රතිවිපාකය යනු,

(1) මූර්ත ආදායම නොවෙනස්ව තිබිය දී නිරපේක්ෂ මිල වෙනස් වීමේ ප්‍රතිඵලයක් ලෙස ඉල්ලුම් ප්‍රමාණය වැඩි වීම.

(2) අනෙකුත් කරුණු නොවෙනස් ව තිබිය දී සාපේක්ෂ මිල අඩු වීම නිසා ඉල්ලුම් ප්‍රමාණය අඩු වීම.

(3) අනෙකුත් කරුණු නොවෙනස්ව තිබිය දී සාපේක්ෂ මිල අඩු වීම නිසා ඉල්ලුම් ප්‍රමාණය වැඩි වීම.

(4) සාපේක්ෂ මිල නොවෙනස් ව තිබිය දී මූර්ත ආදායම අඩු වීම නිසා ඉල්ලුම් ප්‍රමාණය වැඩිවීම.

(5) අනෙකුත් කරුණු නොවෙනස්ව තිබිය දී සාපේක්ෂ මිල වෙනස් වීම නිසා ඉල්ලුම් ප්‍රමාණය වෙනස් වීම.

(11) බාල භාණ්ඩයක් සහ සාමාන්‍ය භාණ්ඩයක් අතර ඇති සමානතාව කුමක් ද?

(1) ආදායම වැඩි වන විට ඉල්ලුම අඩු වීම.

(2) මිල ඉල්ලුම් නම්‍යතාව ධන අගයක් ගැනීම.

(3) මිල ඉල්ලුම් නම්‍යතාව ඍණ අගයක් ගැනීම.

(4) ආදායම් ඉල්ලුම් නම්‍යතාව ඍණ අගයක් ගැනීම.

(5) ආදායම් ඉලල්ම් නම්‍යතාව ධන අගයක් ගැනීම.

(12) යම් පාරිභෝගිකයකු සාමාන්‍ය ඉල්ලුම් වක්‍රය දිගේ පහළට ගමන් කරයි නම්, ඉන් අදහස් වන්නේ,

(1) භාණ්ඩය සඳහා පාරිභෝගික රුචිය අඩු වී ඇති බවයි.

(2) ආදේශන භාණ්ඩයේ මිල ඉහළ යන බවයි.

(3) අනුපූරක භාණ්ඩයේ මිල ඉහළ යන බවයි.

(4) සලකා බලන භාණ්ඩයේ සාපේක්ෂ මිල පහළ වැටී ඇති බවයි.

(5) පාරිභෝගික ආදායම ඉහළ යන බවයි.

(13) පහළට බෑවුම් වන සරල රේඛීය ඉල්ලුම් වක්‍රයක් මත විවිධ ලක්ෂ්‍ය විවිධ නම්‍යතා අගයන් ගනු ලබන්නේ,

(1) බෑවුම් තැනින් තැනට වෙනස් වන බැවිනි.

(2) මිල හා ප්‍රමාණය තැනින් තැනට වෙනස් වන බැවිනි.

(3) බෑවුම ඍණ අගයක් ගන්නා බැවිනි.

(4) මිල හා ඉල්ලුම් ප්‍රමාණය අතර ප්‍රතිලෝම සම්බන්ධයක් පවත්නා බැවිනි.

(5) බෑවුම ධන අගයක් ගන්නා බැවිනි.

(14) ඒකීය සැපයුම් වක්‍රයක් දැක්වෙන සමීකරණය වන්නේ,

(1) $Qs = 10 + 3P$ (2) $Qs = 10P$ (3) $Qs = 10 + 10P$

(4) $Qs = -10 + 10P$ (5) $Qs = -10 + P$

(15) ගිෆන් භාණ්ඩයකට අදාළ නිවැරදි කාණ්ඩය තෝරන්න.

මිල ඉල්ලුම් නම්‍යතාවය	ආදායම් ඉල්ලුම් නම්‍යතාවය
(1) ධන එකට අඩු	ධන
(2) ධන	ඍණ
(3) ධන	ධන 1 ට වැඩි
(4) ඍණ	ඍණ
(5) ඍණ 1 ට වැඩි	ධන

(16) $Qd = 60 - 5P$ වන සරල රේඛීය ඉල්ලුම් වක්‍රයක් සහිත භාණ්ඩයක වෙළඳ පොළ මිල රු. 4/= දී පාරිභෝගික අතිරික්තය සොයන්න.

(1) රු. 240/= යි. (2) රු. 300/= යි. (3) රු. 260/= යි.

(4) රු. 160/= යි. (5) රු. 220/= යි.

(17) එක්තරා භාණ්ඩයක් සම්බන්ධයෙන් ප්‍රතිලෝම ඉල්ලුම් ශ්‍රිතය $P = 50 - 0.5\ Qd$ වේ. මිල රු. 20/= දී මිල ඉල්ලුම් නම්‍යතාව වන්නේ කුමක් ද?

(1) - 0.36 (2) -0.66 (3) -1.44 (4) -1.5 (5) -0.166

(18) කිසියම් භාණ්ඩයක වෙළෙඳ පොල සැපයුම් වක්‍රය පහත රූප සටහනේ දැක්වේ. සැපයුම් වක්‍රය මත සැපයුමේ මිල නම්‍යතාව නිවැරදිව දැක්වෙන්නේ,



(1) එකට වැඩි අගයක් ගනු ලබන අතර සෑම ස්ථානයක දී ම ස්ථාවර ව පවතී.

(2) එකට වඩා අඩු අගයක් ගනු ලබන අතර සෑම ස්ථානයක දීම ස්ථාවරව පවතී.

(3) එකට වඩා වැඩි අගයක් ගනු ලබන අතර නිමැවුම වැඩිවෙත්ම නම්‍යතා අගය අඩු වේ.

(4) එකට වඩා අඩු අගයක් ගන්නා අතර නිමැවුම වැඩි වෙත්ම අගය වැඩි වේ.

(5) ඒකීය වන අතර සෑම ස්ථානයකදී ම ස්ථාවරව පවතී.

(19) භාණ්ඩයක සැපයුම් මිල නම්‍යතාව තීරණය කරන සාධකයක් නොවන්නේ,

(1) සාධක සංචලන හැකියාව. (2) භාණ්ඩයේ ස්වභාවය.

(3) තොග පවත්වාගෙන යාමේ හැකියාව. (4) භාණ්ඩයේ මිල.

(5) මිල වෙනස්වීම හේතුවෙන් සැපයුම වෙනස් වීමට ගත වන කාලය.

(20) පාරිභෝගික ආදායම 10% කින් ඉහළ යන විට X භාණ්ඩයේ ඉල්ලුම 8% කින් ඉහළ ගිය අතර Y භාණ්ඩයේ මිල 10% කින් පහළ යන විට X භාණ්ඩයේ ඉල්ලුම 20% කින් පහළ යන ලදී. මෙම තොරතුරු අනුව නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) X භාණ්ඩය සාමාන්‍ය භාණ්ඩයක් මෙන්ම අනුපූරක භාණ්ඩයක් ද වේ.

(2) X භාණ්ඩය අත්‍යවශ්‍ය භාණ්ඩයක් මෙන්ම ආදේශක භාණ්ඩයක් ද වේ.

(3) X භාණ්ඩය සුඛෝපභෝගී භාණ්ඩයක් මෙන්ම අනුපූරක භාණ්ඩයක් ද වේ.

(4) X භාණ්ඩය සාමාන්‍ය භාණ්ඩයක් මෙන්ම බාල භාණ්ඩයක් ද වේ.

(5) X භාණ්ඩය අත්‍යවශ්‍ය භාණ්ඩයක් මෙන්ම බාල භාණ්ඩයක් ද වේ.

(21) තරගකාරී වෙළෙඳපොලක අලෙවි වන භාණ්ඩයක්ට අදාළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත සමීකරණ මගින් පෙන්නුම් කරයි. මෙම භාණ්ඩයේ සමතුලිත මිලේ දී මිල ඉල්ලුම් නම්‍යතාව කොපමණ ද?

$Qd = 50 - 5P$ (ඉල්ලුම් ශ්‍රිතය) $Qs = -10 + 5P$ (සැපයුම් ශ්‍රිතය)

(1) - 1.4 (2) 1.5 (3) -1.5 (4) -2.5 (5) 2.5

(22) කිසියම් භාණ්ඩයකට අදාළ ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත පරිදි වේ.

$Qd = 100 - 4P$ $Qs = -30 + 6P$ මෙම භාණ්ඩයේ මිල රු. 8 දී අධි ඉල්ලුම,

(1) ඒකක 20 කි. (2) ඒකක 30 කි. (3) ඒකක 40 කි. (4) ඒකක 50කි. (5) ඒකක 60 කි.

(23) සහල් සඳහා වෙලඳපොළ සමතුලිත මිල හා ප්‍රමාණය පිළිවෙලින් රුපියල් 140 සහ ඒකක 160 ක් වේ. මෙම වෙළෙඳපොළට රජය මැදිහත් වී සහල් කිලෝ එකක් විකිණිය හැකි නීත්‍යානුකූල මිල රුපියල් 150 ක් ලෙස නියම කරනු ලැබුවහොත් එහි ප්‍රතිඵලයක් වශයෙන්,

(1) සහල් ඉල්ලුම් ප්‍රමාණය ඉහළ යයි. (2) සම්පත් බෙදා වෙන් කිරීම අකාර්යක්ෂම වේ.

(3) සමස්ත අතිරික්තය වැඩි වේ. (4) පාරිභෝගික අතිරික්තය වැඩි වේ.

(5) සැපයුම ඉක්මවා යන ඉල්ලුමක් හටගනී.

(24) කෘෂිකාර්මික නිෂ්පාදන මත ඒකක සහනාධාරයක් පැනවීමට පෙර හා පසු ඉල්ලුම් හා සැපයුම් ලේඛන පහත වගුව පෙන්නුම් කරයි.

මිල(රුපියල්)	ඉල්ලුම (ඒකක)	සහනාධාරයට පෙර සැපයුම (ඒකක)	සහනාධාරයට පසු සැපයුම (ඒකක)
20	800	0	400
30	600	200	600
40	400	400	800
50	200	600	1000
60	0	800	1200

ඒකක සහනාධාරයේ ප්‍රමාණය හා ඒකක සහනාධාරයෙන් පාරිභෝගිකයා ලබන වාසිය කොපමණ ද?

	ඒකක සහනාධාරය (රු.)	ඒකකයකට පාරිභෝගිකයා ලබන වාසිය (රු.)
(1)	10	5
(2)	10	10
(3)	20	10
(4)	20	5
(5)	20	20

(25) එක්තරා භාණ්ඩයක් සඳහා වෙළඳපොළ ඉල්ලුම් වක්‍රය Qd = 60 - 3P වේ. මෙම භාණ්ඩයේ සමතුලිත මිල ඒකකයක් රුපියල් 13 ක් බව සලකන්න. රජය විසින් මෙම වෙළඳපොළට මැදිහත් වී ඒකකයක් රුපියල් 16 ක් ලෙස අවම මිලක් නීතියෙන් නියම කරනු ලැබීමෙන් පසු පාරිභෝගික අතිරික්තය.

(1) රුපියල් 73. 50 කි.

(2) රුපියල් 54 කි.

(3) රුපියල් 30 කි.

(4) රුපියල් 24 කි.

(5) රුපියල් 20 කි.

(26) කාර්මික භාණ්ඩයකට අදාළ වෙළඳපොල සැපයුම් සමීකරණය Qs = -210 + 3P වේ. මෙම භාණ්ඩයේ නිෂ්පාදනය මත රු. 25 ක ඒකක බද්දක් පනවනු ලබයි නම් බද්දෙන් පසු ඒකක 90 ක් සපයන මිල කොපමණ ද?

(1) රුපියල් 125 (2) රුපියල් 100 (3) රුපියල් 95 (4) රුපියල් 85 (5) රුපියල් 75

(27) වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය වේ නම්, එම භාණ්ඩයේ නිෂ්පාදනය මත පනවනු ලබන වක්‍ර බද්දක් හේතුකරගෙන,

(1) බද්දේ ප්‍රමාණයෙන් ම වෙළෙඳපොළ මිල ඉහළ ය යි.

(2) වෙළෙඳපොල මිල මත කිසිදු බලපෑමක් ඇති නොකරයි.

(3) ඒකක බද්දේ වටිනාකමට වඩා අඩු ප්‍රමාණයකින් වෙළඳපොළ මිල ඉහළ යයි.

(4) බදු බර සම්පූර්ණයෙන් ම පාරිභෝගිකයා මත පතිත වේ.

(5) සාපේක්ෂව අඩු බදු ප්‍රමාණයක් පාරිභෝගිකයා දරයි.

(28) තරගකාරී වෙළඳපොළක අලෙවිකරන කෘෂිකාර්මික භාණ්ඩයකට නිෂ්පාදන සහනාධාරයක් ලබා දෙයි නම් එහි ප්‍රතිඵලයක් වශයෙන්,

(1) සමස්ත ආර්ථික අතිරික්තය ඉහළ නගිනු ඇත.

(2) සමස්ත ආර්ථික අතිරික්තය නොවෙනස්ව පවතිනු ඇත.

(3) සමස්ත ආර්ථික අතිරික්තය අඩු වනු ඇත.

(4) පාරිභෝගික අතිරික්තය අඩු වී නිෂ්පාදන අතිරික්තය වැඩිවනු ඇත.

(5) නිෂ්පාදන අතිරික්තය වැඩි වී පාරිභෝගික අතිරික්තය අඩු වනු ඇත.

(29) ආයතනයක් ආර්ථික ලාභය ගණනයේ දී ආවස්ථික පිරිවැයේ කොටසක් සේ නොසැලකෙන්නේ,

(1) ස්ථාවර පිරිවැය. (2) විචල්‍ය පිරිවැය. (3) මූල්‍ය පිරිවැය.

(4) ආරෝපිත පිරිවැය. (5) ආන්තික පිරිවැය.

(30) නිෂ්පාදන ආයතනයක මුළු අයභාරයෙන් සෘජු පිරිවැය ආවරණය කරගත් පසු තව දුරටත් අතිරික්තයක් පවතී නම් ආයතනය,

(1) ප්‍රාමාණික ලාභ උපය යි. (2) ආර්ථික ලාභ උපය යි. (3) ගණකාධිකරණ ලාභ උපය යි.

(4) ආර්ථික ලාභ ශුන්‍යය වේ. (5) අති ප්‍රාමාණික ලාභ උපයයි.

(31) දිගු කාලීන නිෂ්පාදන ක්‍රියාවලියක් සම්බන්ධයෙන් වලංගු නොවන ප්‍රකාශය කුමක් ද?

(1) ආයතනයේ නිෂ්පාදන පරිමාව ප්‍රසාරණය වේ.

(2) නිමවුම හැසිරෙන ආකාරය පරිමාණානුකූල ඵල මගින් නිරූපණය වේ.

(3) සාධක සංයෝග අනුපාත ස්ථාවරව පවතී.

(4) අඩුවන පරිමාණානුකූල ඵල පවතින විට දිගුකාලීන සාමාන්‍ය පිරිවැය ඉහළ නගී.

(5) මුළු පිරිවැය මුළු විචල්‍ය පිරිවැයට සමාන වේ.

(32) ආයතනයක පරිමාණානුකූල පිරිමැසුම්,

(1) හැම විටම නිෂ්ප්‍රාමාණික ලාභ වැඩි වීමට හේතු වේ.

(2) සාමාන්‍ය පිරිවැය වැඩි වීමට හේතු වේ.

(3) බහු ජාතික සමාගම් වලට ප්‍රතිලාභ ගෙන දීමට හේතු වේ.

(4) නිමවුමේ සමානුපාතික වැඩි වීමට හේතු වේ.

(5) දිගු කාලීන සාමාන්‍ය පිරිවැය පහළ වැටීමට හේතු වේ.

(33) කෙටි කාලීන මුළු ස්ථාවර පිරිවැය යන්නට ඇතුළත් නොකරනුයේ,

(1) බලපත්‍ර ගාස්තු. (2) නුපුහුණු ශ්‍රමිකයින්ට ගෙවන වැටුප්.

(3) රක්ෂණ වාරික. (4) ප්‍රාග්ධනය සඳහා පොලී ගෙවීම්.

(5) කළමණාකරුවන්ට ගෙවන වැටුප්.

(34) කිසියම් නිෂ්පාදන සාධකයක සංක්‍රාම ඉපයීම් එම සාධකයේ වර්තමාන භාවිතයේ,

(1) ආර්ථික බදු කුළියට සමාන වේ. (2) වෙළඳපොළ මිලට සමාන වේ.

(3) ආවස්ථික පිරිවැයට සමාන වේ. (4) මුළු අයභාරයට සමාන වේ.

(5) ආන්තික අයභාරයට සමාන වේ.

(35) හීන වන ආන්තික ඵල හටගන්නා විට යෙදවුමක,

(1) ආන්තික නිෂ්පාදනය ඉහළ නගිමින් පවතී. (2) ආන්තික නිෂ්පාදිතය ශුන්‍ය වේ.

(3) ආන්තික නිෂ්පාදිතය පහළ බසිමින් පවතී. (4) මුළු නිෂ්පාදිතය ශුන්‍ය වේ.

(5) මුළු නිෂ්පාදිතය සෘණ අගයක් ගනී.

(36) පූර්ණ තරගකාරී වෙළඳපොළ ව්‍යුහයක ලක්ෂණයක් වන්නේ පහත සඳහන් කවරක් ද?

(1) ආයතන සමජාතීය භාණ්ඩයක් නිෂ්පාදනය කරයි.

(2) ප්‍රවේශයට බාධා පවතී.

(3) ආයතන මිල සකසමින් ලාභ උපරිම කරයි.

(4) කෙටිකාලයේ දී සෑම විටම ප්‍රාමාණික ලාභ උපයයි.

(5) අහිමි වන ශුභ සාධනය දුරලීම වස් රජය මිල ගණන් නියාමනය කරයි.

(37) නිමවුමේ දළ වටිනාකමින් (GVO) අතරමැදි පරිභෝජනය ඉවත් කළ විට ලැබෙනුයේ,

(1) දළ එකතු කළ අගය යි. (2) ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය යි.

(3) ප්‍රාථමික භාණ්ඩවල වටිනාකම යි. (4) ශුද්ධ ප්‍රාථමික ආදායම යි.

(5) ශුද්ධ වක්‍ර බදුය.

(38) ආර්ථික ප්‍රදේශයක් තුළ ආර්ථික ක්‍රියාකාරකම් වල යෙදී සිටින නේවාසික ආයතනික ඒකකයක් නොවන්නේ,

(1) මූල්‍ය නොවන සමාගම්. (2) මූල්‍ය සමාගම්.

(3) රජය. (4) කුටුම්බ.

(5) ලාභ ආපේක්ෂාවෙන් කුටුම්බ සඳහා සේවා සපයන ආයතන.

(39) දළ දේශීය නිෂ්පාදිතය හා ශුද්ධ දේශීය නිෂ්පාදිතය අතර වෙනස වන්නේ,

(1) ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය. (2) විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම්.

(3) විදේශ ශුද්ධ ද්විතියික ආදායම්. (4) නිෂ්පාදිත සහනාධාර අඩුකළ බදු.

(5) අතරමැදි යෙදවුම් වටිනාකම.

(40) ප්‍රාථමික ආදායම් සංරචකයක් නොවන්නේ,

(1) සේවක ආදායම්. (2) සංක්‍රාම ආදායම්. (3) මෙහෙයුම් අතිරික්තය.

(4) මිශ්‍ර ආදායම්. (5) නිෂ්පාදනය මත ශුද්ධ බදු.

(41) සමාහාර පරිභෝජන වියදම් + දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය + ශුද්ධ අපනයන සමාන වන්නේ,

(1) දළ දේශීය වියදමට යි. (2) දළ දේශීය නිෂ්පාදිතයට යි.

(3) දළ ජාතික ආදායමට යි. (4) ශුද්ධ දේශීය වියදමට යි.

(5) වැය කළ හැකි දළ ජාතික ආදායමට යි.

(42) කල්පිත ආර්ථිකයක සාර්ව ආර්ථික දත්ත කීපයක් පහත දැක් වේ. (රු. බිලියන වලිනි)

ආණ්ඩුවේ මිලදී ගැනීම්	300
ශ්‍රමික ආදායම්	1 000
ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය	100
දළ ආයෝජන	200
පෞද්ගලික පරිභෝජනය	1 800
ශුද්ධ අපනයන	-50

මෙම ආර්ථිකයේ වෙළඳ මිලට ශුද්ධ දේශීය නිෂ්පාදිතය,

(1) රු. බි. 2 150 කි. (2) රු. බි. 2 250 කි. (3) රු. බි. 2 300 කි.

(4) රු. බි. 2 800 කි. (5) රු. බි. 3 150 කි.

(43) රටක දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරන විට ඇතුළත් **නොකරන්නේ** පහත දැක්වෙන ගනුදෙනු වලින් කවරක් ද?

(1) පෞද්ගලික පරිභෝජනය සඳහා පාරිභෝගිකයෙකු විසින් අළුත් මෝටර් රථයක් මිල දී ගැනීම.

(2) සමාගම් නිකුත් කරන බැඳුම් කර සඳහා ලැබෙන පොලිය.

(3) නිවසක් කුලියට දීමෙන් අය කරන බදු කුලිය.

(4) මූල්‍ය සමාගමක කොටස් 100 ක් මිලට ගැනීම.

(5) රක්ෂණ ඔප්පුවක් මිලදී ගැනීම.

(44) 2022 වර්ෂයේ දී පවත්නා වෙළඳපොල මිල යටතේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනය ඇමරිකානු ඩොලර් බිලියන,

(1) 72 කි. (2) 75.2 කි. (3) 77.1 කි. (4) 89 කි. (5) 90 කි.

(45) රජයේ කටයුතු නොමැති ආවෘත ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය $c = 50 + 0.75\ y$ වේ නම් ද මෙම ආර්ථිකයේ සමතුලිත ආදායම රු. මි. 1 500 ක් වේ නම් ආයෝජන මට්ටම කොපමණ වේ ද?

(1) රු. මි. 325 කි. (2) රු. මි. 950 කි. (3) රු. මි. 1025 කි. (4) රු. මි. 1125 කි. (5) රු. මි. 1175 කි.

(46) කල්පිත ආර්ථිකයක ස්වායත්ත පරිභෝජනය රු. මි. 200 ක් වන අතර ඉහළ යන ආදායමේ සෑම රුපියල්කින්ම ශත 75 ක් පරිභෝජනයට යොදවයි. රජය ආර්ථිකයට මැදිහත් වී රු. මි. 20 ක ශුද්ධ බදු ආදායමක් උපයා ගනී නම් ආර්ථිකයේ පරිභෝජන ශ්‍රිතය,

(1) $C = 400 + 0.75\,y$ (2) $C = 200 + 0.75\,y$ (3) $C = 175 + 0.75\,y$

(4) $C = 180 + 0.75\,y$ (5) $C = 185 + 0.75\,y$

(47) පහත දැක්වෙන්නේ කල්පිත ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය වෙනස් වන ආකාරයකි.

මෙහි ප්‍රස්තාරයෙන් පෙන්නුම් කරන පරිදි පරිභෝජන ශ්‍රිතය C සිට C_1 දක්වා වැඩි වේ නම් පහත ප්‍රකාශ අතුරින් කවරක් සත්‍ය වේ ද?



	ස්වාධීන වියදම් ගුණකය	සමතුලිත ජාතික ආදායම	ආන්තික ඉතුරුම් නැමියාව
(1)	වැඩි වේ.	වැඩි වේ.	අඩු වේ.
(2)	වැඩි වේ.	වැඩි වේ.	වැඩි වේ.
(3)	වෙනස් නොවේ.	අඩු වේ.	වැඩි වේ.
(4)	වෙනස් නොවේ.	වැඩි වේ.	අඩු වේ.
(5)	අඩු වේ.	වැඩි වේ.	වැඩි වේ.

(48) ස්ථාවර බදු පමණක් දක්නට ලැබෙන රජයේ ආර්ථික කටයුතු සහිත ආවෘත ආර්ථිකයක ආන්තික ඉතුරුම් නැමියාව (MPS) 0.2 කි. ආණ්ඩුවේ මිලදී ගැනීම් රු. බි. 100 කින් ඉහළ යාම නිසා නිමැවුම උපරිම වශයෙන් වැඩි වනුයේ,

(1) රු. බි. 100 කිනි. (2) රු. බි. 300 කිනි. (3) රු. බි. 400 කිනි.

(4) රු. බි. 500 කිනි. (5) රු. බි. 600 කිනි.

(49) සරල ආර්ථිකයක සමතුලිත ආදායම රු. මි. 5000 ක් ය යි ද ආන්තික පරිභෝජන නැමියාව 0.9 ක් ය යි ද සිතන්න. සමතුලිත ආදායම රු. මි. 6000 තෙක් ඉහළ නැංවීම සඳහා ආයෝජන වැඩි විය යුත්තේ,

(1) 100 කිනි. (2) 500 කිනි. (3) 800 කිනි. (4) 900 කිනි. (5) 1000 කිනි.

(50) සමතුලිත ජාතික ආදායම් රේඛාවට ඉහළින් පරිභෝජන රේඛාව ගමන් කරන විට,

(1) ආන්තික පරිභෝජන නැමියාව සාමාන්‍ය පරිභෝජන නැමියාවට සමාන වේ.

(2) සාමාන්‍ය පරිභෝජන නැමියාව 1 ට වැඩි වේ.

(3) සාමාන්‍ය පරිභෝජන නැමියාව 1 ට අඩු වේ.

(4) ආන්තික ඉතුරුම් නැමියාව ආන්තික පරිභෝජන නැමියාව ඉක්මවා යයි.

(5) ආන්තික ඉතුරුම් නැමියාව සාමාන්‍ය පරිභෝජන නැමියාව ඉක්මවා යයි.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 12 - 2023

විභාග අංකයඃ ....

ආර්ථික විද්‍යාව - II

කාලය පැය 03 යි
(අමතර කියවීම් කාලය විනාඩි 10 යි)

උපදෙස්:-
- ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 'අ' හා 'ආ' උප කොටස් වලින් එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින් වත් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

'අ' උප කොටස

01. (i) ''සෑම ආර්ථික ගැටළුවක්ම තේරීම හා බැඳී පවතී.'' මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? පිළිතුර පැහැදිලි කරන්න. (ල.04)

(ii) නිෂ්පාදන සාධකයක් ලෙස ''ශ්‍රමය'' මානව ප්‍රාග්ධනයෙන් වෙනස් වන්නේ කෙසේ ද? (ල.04)

(iii) අ) ''ප්‍රාග්ධනය'' අර්ථ දක්වන්න. (ල.02)

ආ) සාර්ථක ව්‍යවසායකයෙකු සතු ලක්‍ෂණ 04 ක් නම් කරන්න. (ල.02)

(iv) ආර්ථික කාර්යක්‍ෂමතාවය සාක්ෂාත් කර ගැනීම. සඳහා සපුරා ගත යුතු කොන්දේසි කවරේද ? (ල.04)

(v) ආර්ථිකයේ සම්පත් සම්භාරයේ අඩුවීමක් නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයට කෙබඳු බලපෑමක් සිදු කරයි ද? රූප සටහනක් ඇසුරෙන් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ල.04)

02. (i) ආර්ථික පද්ධතියක් තුළ දක්නට ලැබෙන ආයතනික ලක්‍ෂණ කවරේද? (ල.04)

(ii) අ) වෙළඳපොළ ආර්ථික පද්ධතියක දක්නට ලැබෙන ලක්‍ෂණ 03 ක් සඳහන් කරන්න. (ල.03)

ආ) සානුබල ප්‍රමාණවත් නොවීම සැලසුම්ගත ආර්ථික ක්‍රමයක දැකිය හැකි ප්‍රබල දුබලකමක් වන්නේ ඇයි? (ල.03)

(iii) ''සමාජ වෙළඳපොළ'' ආර්ථිකයත්, 'සමාජවාදී වෙළඳපොළ' ආර්ථිකයකින් වෙනස් වන්නේ කෙසේ ද? (ල.04)

(iv) රටක නිෂ්පාදනය වර්ධනය කිරීමෙහි ලා විශේෂීකරණයේ වැදගත් කම සැකෙවින් පැහැදිලි කරන්න. (ල.06)

03. (i) ඉල්ලුම වෙනස් වීමට බලපාන සාධක 05 ක් ලියන්න. (ල.05)

(ii) පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදන අතිරික්තය නිර්වචනය කරන්න. (ල.04)

(iii) පහත ඉල්ලුම් සැපයුම් සමීකරණ ඔබට සපයා ඇත.

$Qd = 2000 - 200P$

$Qs = -1000 + 400P$

a) සමතුලිත මිල හා ප්‍රමාණය සොයන්න. (ල.02)

b) සමතුලිතයේ දී ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාව සොයන්න. (ල.02)

c) සමතුලිතයේ දී ආර්ථික අතිරික්තය සොයන්න.

(iv) X සහ Y අනුපූරක භාණ්ඩ වේ. අනෙකුත් කරුණු නොවෙනස්ව තිබිය දී Y භාණ්ඩයේ සැපයුම් වැඩි වීමක් නිසා X භාණ්ඩයේ සමතුලිත මිල සහ ප්‍රමාණය මත කවර බලපෑමක් ඇති කරන්නේ ද යන්න රූප සටහනක් මගින් පැහැදිලි කරන්න. (ල.04)

04. (i) ප්‍රාථමික බෝග වගා කරන ගොවීනගේ ආදායම ස්ථාය කිරීම සඳහා රජය සුලභ වශයෙන් යොදා ගන්නා ක්‍රියා මාර්ග පැහැදිලි කරන්න. (ල.06)

(ii) රජය විසින් ඇතැම් සුවිශේෂී භාණ්ඩ හා සේවා සඳහා උපරිම මිල සීමා පනවනු ලබන්නේ පාරිභෝගිකයාට අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට හැකි වන ආකාරයටය.

a) උපරිම මිල සීමාවක් යනු කුමක් ද? (ල.02)

b) උපරිම මිලක් නියම කිරීම මගින් සම්පත් බෙදා වෙන් කිරීම කාර්යක්ෂම කරයි ද? රූප සටහනකින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ල. 06)

(iii) කිසියම් භාණ්ඩයක් සඳහා පවත්නා වෙළෙඳපොළ ඉල්ලුම් සැපයුම් වක්‍ර පහත සමීකරණ පෙන්නුම් කරයි.

$$Qd = 60 - 3P \qquad Qs = -10 + 2P$$

මෙම භාණ්ඩය වෙළඳපොලේ අලෙවි කළ හැකි අවම මිල රුපියල් 16 ක් ලෙස රජය විසින් නියම කර තිබේ යැයි සලකන්න.

අ) අවම මිලට පසු වෙළඳපොලේ හට ගන්නා අධි සැපයුම කොපමණ ද?

ආ) අවම මිලට පසු පාරිභෝගික අතිරික්තය කොපමණ ද? (ල.02 බැගින් මුළු ලකුණු 04)

(iv) අවම මිල සහතික කිරීමට ආණ්ඩුවකට ගත හැකි ක්‍රියාමාර්ග කවරේ ද? (ල.02)

05. (i) නිෂ්පාදන සහනාධාරයක් නිසා වෙළඳපොලේ හට ගන්නා ශුභසාධන ප්‍රතිවිපාක පහත රූප සටහන මගින් පෙන්නුම් කරයි.



අ) සහනාදාරයට පසු පාරිභෝගික අතිරික්තය නිරූපණය කරන්නේ කවර ප්‍රදේශයෙන් ද?

ආ) සහනාධාරයට පසු නිෂ්පාදන අතිරික්තය නිරූපණය කරන්නේ කවර ප්‍රදේශයෙන් ද?

ඉ) සහනාධාරය සඳහා රජයේ පිරිවැය පෙන්නුම් කරන්නේ කුමන ප්‍රදේශයෙන් ද?

(ල.02 බැගින් මුළු ලකුණු 06)

(ii) කිසියම් පාරිභෝගික භාණ්ඩයකට අදාළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත සමීකරණ පෙන්නුම් කරයි

$Qd = 300 - 10P$ $Qs = -100 + 10P.$

රජය මෙම භාණ්ඩය මත ඒකකයකට රුපියල් 6 ක් වන සේ දේශීය භාණ්ඩ බද්දක් නිෂ්පාදකයින් මත පනවා ඇතැයි සලකන්න.

a) මෙම තොරතුරු ප්‍රස්තාර සටහනකින් ඉදිරිපත් කර නව සමතුලිත මිල හා ප්‍රමාණය එහි දක්වන්න. (ල. 04)

b) දේශීය භාණ්ඩ බද්දෙන් රජය අය කර ගන්නා අයභාරය කොපමණ ද? (ල. 02)

c) බද්ද නිසා අහිමි වන සමාජ ශුභසාධනය ගණනය කරන්න. (ල. 04)

(iii) අනම්‍ය සැපයුමක් හා නම්‍ය ඉල්ලුමක් පවතින කෘෂි කාර්මික භාණ්ඩයක් සඳහා රජය විසින් නිෂ්පාදකයින්ට ඒකක සහනාධාරයක් ලබා දේ නම්, නිෂ්පාදකයින් සහ පාරිභෝගිකයින් අතර ආර්ථික අතිරික්තය කෙසේ බෙදී යනු ලැබේ ද? රූප සටහනකින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ල. 04)

'ආ' උප කොටස

06. (i) වෙළෙඳපොළ ව්‍යුහ ඔබ වර්ග කරන්නේ කෙසේ ද? (ල. 04)

(ii) ඒකාධිකාරී වෙළෙඳපොල ව්‍යුහයක කැපී පෙනෙන ලක්‍ෂණ 04 ක් දක්වන්න. (ල. 04)

(iii) පහත දැක්වෙන වෙළෙඳපොළ කුමන වෙළෙඳ පොළ ව්‍යුහයකට අයත් දැයි ලියා දක්වන්න.

- ආපන ශාලා
- බාබර් සාප්පු
- දුම්රිය සේවා
- රූපවාහිනී සේවා
- වී සහ බඩ ඉරිඟු

(ල. 05)

(iv) පහත සංකල්ප අතර වෙනස පැහැදිලි කරන්න.

a) සාමාන්‍ය නිෂ්පාදනය හා සාමාන්‍ය පිරිවැය.

b) ආන්තික නිෂ්පාදිතය හා ආන්තික පිරිවැය. (ල. 07)

07. (i) අ) නිෂ්පාදන ශ්‍රිතය යන්න පැහැදිලි කරන්න. (ල. 02)

ආ) නිෂ්පාදන ක්‍රියාවලියේ කෙටිකාලය හා දිගු කාලය අතර වෙනස කුමක් ද? (ල. 06)

(ii) පහත ලක්‍ෂණ පදනම් කරගෙන ඒකාධිකාරී තරඟය හා පූර්ණ තරඟය සංසන්දනය කරන්න.

ලක්‍ෂණය	පූර්ණ තරඟය	ඒකාධිකාරී තරඟය
1. ආයතන සංඛ්‍යාව.		
2. නිපදවන භාණ්ඩවල ස්වරූපය.		
3. පිවිසුම හා පිටවුම.		
4. මිල තීරණය වීම.		
5. ඉල්ලුම වක්‍රය.		

(සැසඳෙන ඕනෑම ලක්‍ෂණයකට ල. 1 බැගින් ල. 05 යි)

(iii) අ) ඒකාධිකාරී කර්මාන්තයට ආයතනයකට අලුතින් ප්‍රවේශවීම වළක්වන ස්වාභාවික හෝ කෘත්‍රිම හෝ ස්වරූපයේ බාධක පවතී. එම බාධක 03 ක් ලියා දක්වන්න. (ල. 03)

ආ) ආර්ථික බදු කුළිය හා සංක්‍රාම ඉපයීම යන්න ලියා දක්වා නම්‍ය සාධක සැපයුම් අවස්තාවේ දී හා අනම්‍ය සාධක සැපයුම් අවස්තාවේ දී සාධක ඉපැයුම් බෙදී යන ආකාරය දක්වන්න.

(ල. 04)

08. (i) පහත සඳහන් ගණුදෙනු දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ දී ඇතුලත් කෙරෙන ගනුදෙනු හා ඇතුලත් නොකෙරෙන ගනුදෙනු ලෙස වෙන් කර දක්වන්න.

අ) ගෘහණියක් විසින් තම පවුලේ සාමාජිකයින්ට ඇඳුම් මසා දීම.

ආ) පියා විසින් තම දරුවන් පාසල් වෙත ගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් ලබා දීම.

ඇ) තමන් සතුව ඇති තමන් පදිංචි වී සිටින නිවාස වලින් ලබාදෙන නේවාසික සේවය.

ඉ) තම පරිභෝජනය සඳහා කෘෂි නිෂ්පාදනය කිරීම. (ල. 04)

(ii) නිෂ්පාදන ක්‍රියාවලියේ දී යොදා ගැනෙන ප්‍රාථමික යෙදවුම් සහ අතරමැදි යෙදවුම් අතර වෙනස පැහැදිලි කරන්න. (ල. 04)

(iii) පහත සඳහන් වන්නේ කල්පිත ආර්ථිකයකට අදාළ ආර්ථික දක්වා කීපයකි. සියලු ගණුදෙනු (රු. මිලියන වලිනි)

- සේවක ආදායම් 4 500
- දළ මෙහෙයුම් අතිරික්තය 9 000
- ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය 200
- නිෂ්පාදනය මත වෙනත් බදු අඩු කළ පසු එම සහනාධාර 100
- නිෂ්පාදිතය මත ශුද්ධ බදු 1 600
- විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම් -600
- විදේශීය ශුද්ධ ද්විතියික ආදායම් 2000

මෙෘ ගණනය කරන්න.

අ) මූලික මිලට දළ එකතු කළ අගය. (ල. 02)

ආ) දළ දේශීය නිෂ්පාදිතය. (ල. 02)

ඉ) ශුද්ධ ජාතික ආදායම. (ල. 02)

(iv) රාජ්‍ය අංශය හා විදේශ අංශය රහිත සරල ආර්ථිකයක ජාතික ආදායම සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

පරිභෝජන ශ්‍රිතය $= C = 0.8\,Y$

ආයෝජන $I = 400$

අ) මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම සොයන්න.

ආ) මෙම ආර්ථික යේ ඉතුරුම් හා ආයෝජන සමාන වන බව ඔප්පු කරන්න.

ඇ) ඉහත (අ) හි දැක්වෙන පරිභෝජන ශ්‍රිතය $C = 200 + 0.8\,Y$ ලෙස වෙනස් වූයේ නම් සමතුලිත ජාතික ආදායම කොපමණ වේ ද? (ල. 02)

09. (i) සමස්ත ආර්ථික තුළ නිෂ්පාදන ක්‍රියාවලියට දායක වන නේවාසික ආයතනික ඒකක කවරේ ද? (ල. 04)

(ii) රටක දළ දේශීය නිෂ්පාදිතය හා දළ ජාතික ආදායම අතර වෙනස පැහැදිලි කරන්න. (ල. 04)

(iii) පහත සඳහන් කල්පිත ආර්ථික දත්ත පදනම් කරගෙන අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
(රු. මිලියන වලිනි)

කෘෂි අංශයේ දළ එකතු කළ අගය	1 800
කාර්මික අංශයේ දළ එකතු කළ අගය	2 000
සේවා අංශයේ දළ එකතු කළ අගය	2 500
වෙළඳ ආන්තිකය	100
විදේශීය ප්‍රාථමික ආදායම් ලැබීම්	600
විදේශීය ප්‍රාථමික ආදායම් ගෙවීම්	700
ශුද්ධ බදු	200

අ) මූලික මිලට එකතු කළ අගය සොයන්න. (ල. 01)

ආ) වෙළඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය කොපමණ ද? (ල. 02)

ඇ) දළ ජාතික ආදායම ගණනය කරන්න. (ල. 02)

(iv) කිසියම් ආර්ථිකයක සමතුලිත ජාතික ආදායම 500 සිට 550 දක්වා වැඩි වූ අතර පරිභෝජන වියදම් 450 සිට 480 දක්වා වැඩි විය. ස්වාධීන පරිභෝජනය 100 කි.

අ) මෙම ආර්ථිකයේ ආන්තික පරිභෝජනය නැමියාමසොයන්න. (ල. 01)

ආ) පරිභෝජන ශ්‍රිතය හා ඉතුරුම් ශ්‍රිතය ලියා දක්වන්න. (ල. 02)

(v) ආන්තික පරිභෝජන නැමියාව හා සාමාන්‍ය පරිභෝජන නැමියාව අතර වෙනස පැහැදිලි කරන්න. (ල. 04)

10. (i) රජය විසින් කරනු ලබන පොලී ගෙවීම් ජාතික ආදායමේ සංරචකයක් ලෙස නොසලකන්නේ ඇයි? (ල. 03)

(ii) දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය යනු කුමක් ද? එය ගණනය කරනු ලබන්නේ කෙසේ ද? (ල. 03)

(iii) වියදම් ප්‍රවේශය ඔස්සේ දළ දේශීය නිෂ්පාදිතය මිනුම් කිරීමේ සැලකිල්ලට ගැනෙන ප්‍රධාන වියදම් සංරචක කවරේද? (ල. 04)

(iv) $C = 50 + 0.75$ ශා යන පරිභෝජන ශ්‍රිතය සහිත ආර්ථික යක ආයෝජන වියදම් රු. මි. 500 ක් ද රජයේ පරිභෝජන වියදම් රු. මි. 400 ක් ද බදු ආදායම රු. මි. 400 ක් ද වේ නම්,

අ) සමතුලිත ජාතික ආදායම කොපමණ ද? (ල. 02)

ආ) මෙම ආර්ථිකයේ විභව දළ දේශීය නිෂ්පාදිතය රු. මි. 3 600 ක් වේ නම් ආර්ථිකයේ අවධමනාත්මක පරතරයක් හෝ උද්ධමනාත්මක පරතරයක් පවතී ද? ඒ කොපමණ ද?(ල. 02)

(v) ආණ්ඩුවේ ආර්ථික කටයුතු සහ විදේශ වෙළඳාම සහිත ආර්ථිකයක දළ දේශීය නිෂ්පාදිතයේ සමතුලිතය තීරණය වන ආකාරය සමහර වියදම් ප්‍රවේශය සහ විදීම් - කාන්දුවීම් ප්‍රවේශය ඔස්සේ ප්‍රස්තාරිකව පැහැදිලි කරන්න. (ල. 06)

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
තෙවන වාර පරීක්ෂණය - 2023

12 ශ්‍රේණිය **ආර්ථික විද්‍යාව** **පිළිතුරු පත්‍රය**

I පත්‍රය

1 -(1) 2 -(2) 3 -(3) 4 -(4) 5 -(4) 6 -(2) 7 -(3) 8 -(4) 9 -(4) 10-(3)
11-(3) 12-(4) 13-(2) 14-(2) 15-(2) 16-(4) 17-(2) 18-(4) 19-(4) 20-(2)
21-(3) 22-(4) 23-(2) 24-(3) 25-(4) 26-(1) 27-(2) 28-(3) 29-(5) 30-(3)
31-(3) 32-(5) 33-(2) 34-(3) 35-(3) 36-(1) 37-(1) 38-(5) 39-(1) 40-(2)
41-(2) 42-(1) 43-(4) 44-(3) 45-(1) 46-(5) 47-(1) 48-(4) 49-(1) 50-(2)

(ලකුණු ....)

II පත්‍රය

01. (i) සීමිත සම්පත් ප්‍රමාණයක් පවතින ආර්ථිකයක් තුළ අසීමිත මිනිස් වුවමනා සපුරා ගැනීමට යාමේ දී හිඟකම නැමැති කේන්ද්‍රීය ගැටළුව මතු වේ. සීමිත සම්පත් වලින් සියළු මිනිස් වුවමනා සපුරා ගත නොහැකි බැවින් එම වුවමනා අතර තේරීමක් කිරීමට සිදු වේ. (ල. 02)

වුවමනාවන්ට සාපේක්ෂව සම්පත් හිඟවීමත් හිඟ සම්පත් වල විකල්ප භාවිත පැවතීමත් නිසා සෑම ආර්ථික ගැටළුවක්ම පැන නගින අතර, ඒ නිසාම තේරීම් කිරීමට සිදුවීම නොවැළැක්විය හැකි කරුණකි. ඒ අනුව ඕනෑම ආර්ථික ගැටළුවක් මූලික මට්ටමින් බලන විට පෞද්ගලික තේරීමක් හා සම්බන්ධ අතර මෙය ඕනෑම පුද්ගලයෙකුට හෝ සමාජයකට පොදු වේ. (ල. 02)

(ii) භාණ්ඩ හා සේවා නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදාගත හැකි මිනිසා සතු සියලුම කායික හා මානසික ප්‍රයත්නයන් ශ්‍රමය ලෙස හැඳින්විය හැක. (ල. 01)

"අධ්‍යාපනය, පුහුණුවීම් සහ අත්දැකීම් තුළින් ශ්‍රමික දැනුම හා කුසලතා වර්ධනය කර ගැනීමේ ක්‍රියාවලිය මානව ප්‍රාග්ධනය ලෙස හැඳින් වේ. නැතහොත් ශ්‍රම හමුදාව විසින් සමුච්චනය කරගනු ලැබූ දැනුම, කුසලතා හා අත්දැකීම් සමහාරයයි. (ල. 01)

මානව ප්‍රාග්ධනය	ශ්‍රමය
• ආයෝජනයේ ප්‍රතිඵලයකි. • ඵලදායීතාව වැඩියි. • විශාල දැනුම් සම්භාරයක් අත්කර ගෙන ඇත. • ප්‍රාග්ධනයේ කොටසක් ලෙස සලකයි.	• ආයෝජනයේ ප්‍රතිඵලයක් නොවේ. • ඵලදායීතාව අඩුයි. • සාපේක්ෂව අඩු දැනුම් සම්භාරයක් ඇත. • එසේ නොසලකයි.

(ඕනෑම වෙනස්කම් 02 කට ල. 02)

(iii) අ) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලියට ආධාර කර ගැනීම සඳහා, මිනිසා විසින් නිපදවන ලද, නැවත නැවතත් නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගත හැකි, ක්ෂය වීමෙන් අවසන් වන නිෂ්පාදන ආධාරක ප්‍රාග්ධනය ලෙස හැඳින් වේ. (ල. 02)

ආ) • ආත්ම විශ්වාසය • ආරම්භක ශක්තිය, • ස්වශක්තිය කෙරෙහි විශ්වාසය, • අභියෝගවලට සාර්ථකව මුහුණ දීමේ හැකියාව, • නායකත්ව ගුණාංග, • අනාගත දැක්ම. (ඕනෑම වෙනස්කම් 02 කට ල. 02)

(iv) ආර්ථික කාර්යක්ෂමතාවය අත්කර ගැනීම සඳහා සපුරා ගත යුතු ප්‍රධාන කොන්දේසි 02 කි.

• නිෂ්පාදන කාර්යක්ෂමතාවය ⋆ පූර්ණ සේවා නියුක්තිය. ⋆ පූර්ණ නිෂ්පාදනය (ල. 02)

• සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාවය. ⋆ ආන්තික පිරිවැය = ආන්තික ප්‍රතිලාභ.

$$MC = MB$$ (ල. 02)

(නිෂ්පාදන කාර්යක්ෂමතාවය හා සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාවය පමණක් ලියා ඇත්නම් ලකුණු 02 ක් පමණක් හිමි වේ.)

(v) යම් දෙන ලද අවස්ථාවක නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය ගොඩනගන්නේ සම්පත් සම්භාරය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ස්ථාවරව පවතී යැයි උපකල්පනය කරමිනි. යම් දෙන ලද අවස්ථාවක ස්ථාවර යැයි සලකන ලද සාධක යම් වෙනසකට ලක් වුවහොත් නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය ද වෙනස් වේ. එනම් වක්‍රය දකුණට හෝ වමට විතැන් වීමක් සිදු වේ. ඒ අනුව සම්පත් සම්භාරයේ අඩු වීමක් සිදු වුවහොත් ආර්ථිකයේ නිෂ්පාදන හැකියාව ද අඩු වන බැවින් නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය වමට විතැන් වේ. (ල. 02)



(නිවැරදි ප්‍රස්ථාර සටහනට ල. 02)

02. (i) • කුටුම්බ, • ආණ්ඩුව, • ව්‍යාපාරික අංශය, • කම්කරු සංවිධාන, • රාජ්‍ය නොවන සංවිධාන, • වෙළඳපොලවල්, • සානු වල, • නෛතික ව්‍යුහය, • සිරිත් විරිත් සම්ප්‍රදායන් හා සංස්කෘතිය.

(එක් කරුණකට 01 බැගින් ඕනෑම කරුණු 04 ට ල. 04)

(ii) (අ) • දේපොළ පිළිබඳ පෞද්ගලික හිමිකම්, • නිදහස් ව්‍යවසාය හා නිදහස් තේරීම්, • පාරිභෝගික ස්වාධිපත්‍යය, •වෙළෙඳපොළවල් තරඟකාරී වීම, • ස්වර්ථය පදනම් කරගත් සානුබල පැවතීම, • මිල යන්ත්‍රණ මත මූලික ආර්ථික ප්‍රශ්න විසඳීම, • ආණ්ඩුවේ කාර්යභාරය සීමිත වීම. (ඕනෑම කරුණු 03 ට ල. 03)

(ආ) • කිසියම් බලධාරියෙකු විසින් හෝ මධ්‍යම සැලසුම් අධිකාරියක් විසින් හෝ දෙනු ලබන නියෝග මගින් මූලික ආර්ථික ප්‍රශ්න විසඳාගනු ලබන ආර්ථික පද්ධතියන් සැලසුම් ගත ආර්ථික පද්ධතියක් වේ. නිෂ්පාදන ඒකක වෙත සානුබල සැපයෙන ප්‍රබල යන්ත්‍රණයක් ක්‍රියාත්මක නොවීම මෙම ආර්ථික පද්ධතිවල ප්‍රබල අඩු පාඩුවකි. (ල. 10)

• ලාභය සානුබලයක් නොවන නිසා ලාභ හට ගන්නා විට නිෂ්පාදනය ප්‍රසාරණය කිරීමට හෝ පාඩු ලබන විට නිමැවුම සංකෝචනය කිරීමට හෝ පෙළඹුමක් සිදු නොවේ.

• අකාර්යක්ෂම නිෂ්පාදන ඒකක පවා අඛණ්ඩව නිෂ්පාදන ක්‍රියාවලිය තුළ රැඳී සිටීමට කටයුතු කළ හැකිය.

• පෙළඹවීමක් නොමැති නිසා නව්‍යතා හඳුන්වාදීමේ ක්‍රියාවලිය ද දුර්වල මට්ටමක පවතී.

(තහවුරු කෙරෙන ඕනෑම එක් කරුණකට ල. 02)

(iii) • වෙළඳපොල ආර්ථික පද්ධතියක් තුළ සමාජ සාධාරණත්වය දැඩිව අවධාරණය කරන ආර්ථික පද්ධතියක් සමාජීය වෙළෙඳපොල ආර්ථිකයක් ලෙස හැඳින් වේ. (ල. 01)

• සමාජ වෙළඳපොල ආර්ථිකයන් හි රජය විසින් සිවිල්, දේශපාලන, ආර්ථික, සමාජ හා සංස්කෘතික යන මානව හිමිකම් ආරක්‍ෂා කිරීමට කටයුතු කරයි.

• රජය විසින් පුරවැසියන් වෙත සමාජ ආරක්‍ෂණ ජාලයක් සපයනු ලැබේ.

• ආදායම් ව්‍යාප්ති විෂමතා හැකිතාක් අවම මට්ටමින් පවත්වා ගැනීමට කටයුතු කරයි. උදා: ප්‍රංශය(ල. 01)

• සමාජවාදී වෙළෙඳපොළ ආර්ථිකයක් යනු මූලික වශයෙන් සමාජවාදී දර්ශනයක් මත මෙහෙයවන කිසියම් දුරකට වෙළඳපොළ බලවේග වලට ක්‍රියාත්මක වීමට ඉඩ සලසා ඇති ආර්ථිකයකි. (ල. 01)

• සමාජවාදී වෙළඳපොළ ආර්ථිකවල සම්පත් අයිතිය රජය සතුය. සම්පත් පිළිබඳ තීරණ ගැනීම පෞද්ගලික අංශය සතුය. උදා: චීනය (ල. 01)

(iv) • පුද්ගලයෙකු තමා වඩාත්ම දක්‍ෂ, වැඩිම නිපුණතාව හෝ ඵලදාවක් සහිත කිසියම් කාර්යයක් නිරත වීම විශේෂීකරණය ලෙස හැඳින් වේ. විශේෂීකරණය නිසා තෝරා බේරා ගැනීමකින් තොරව විවිධ දෑ කිරීමට උත්සාහ නොකොට තමා වඩාත් දක්‍ෂ හා තමාට වඩාත් ගැළපෙන කාර්යයන්හි නිරත වීමට පුද්ගලයාට හැකි වේ. මේ නිසා ඵලදායීතාවය ඉහළ යයි. (ල. 02)

• පුද්ගලයෙකුට තමා වඩාත් දක්‍ෂ හා ගැළපෙන කාර්යය තෝරා ගත හැකි බැවින්, තම හැකියා වලින් උපරිම ප්‍රයෝජනය ලබා ගත හැකිය. එමගින් නිෂ්පාදනය වර්ධනය වේ.

- විශේෂීකරණය හරහා නිෂ්පාදන ක්‍රියාවලියට ප්‍රාග්ධනය භාවිතා කිරීමේ හැකියාව පුළුල් වේ. ඒ තුළින් ඵලදායීතාව වර්ධනය වේ.
- නිෂ්පාදන ක්‍රියාවලිය තුළ (මහා පරිමාණ) පරිමාණානුකූල පිරිමැසුම් අත්කර ගැනීමට හැකි වීම හරහා සාමාන්‍ය පිරිවැය පහළ මට්ටම පවත්වා ගැනීමට හැකි වේ.
- නව්‍යතා බිහි වීමේ හැකියාව වර්ධනය වේ.
- හුවමාරු ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම වේ.

(වැදගත්කම පැහැදිලි කෙරෙන එක් කරුණකට ල. 01 බැගින් කරුණු 03 ට ල. 03)

03. (i) 1. පාරිභෝගික රුචිය වෙනස් වීම, 2. පාරිභෝගික ආදායම වෙනස් වීම. 3. සම්බන්ධිත භාණ්ඩ වල මිල ගණන් වෙනස් වීම. 4. ගැනුම්කරුවන්ගේ සංඛ්‍යාව වෙනස් වීම. 5. ගැනුම් කරුවන්ගේ අනාගත අපේක්ෂාවන් වෙනස් වීම.

(ii) පාරිභෝගික අතිරික්තය යනු වෙළෙඳ පොලේ හුවමාරු කරගනු ලබන සමතුලිත භාණ්ඩ ප්‍රමාණය සඳහා පාරිභෝගිකයා ගෙවීමට කැමති මිලක් සත්‍ය වශයෙන්ම ගෙවන මිලත් අතර වෙනසයි. (ල. 02)

$$\text{පාරිභෝගික අතිරික්තය} = \frac{(\text{උපරිම ඉල්ලුම් මිල - ස. මි.}) \times \text{ස. ප්‍ර}}{2}$$

නිෂ්පාදන අතිරික්තය යනු සැපයුම්කරුවන් භාණ්ඩ සඳහා අපේක්ෂා කරන අවම මිලක් (ආන්තික පිරිවැය) සත්‍ය වශයෙන්ම ඔවුන් වෙළෙඳ පොලේ දී ලැබෙන මිලක් අතර වෙනසයි.

$$\text{නිෂ්පාදන අතිරික්තය} = \frac{(\text{ස. මිල - අවම සැ. මි.}) \times \text{ස. ප්‍ර}}{2}$$

නිෂ්පාදන අතිරික්තය යනු මුළු අයභාරයෙන් (R) මුළු විචල්‍ය පිරිවැය (TVC) අඩු කළ විට ලැබෙන අගයයි.

නිෂ්පාදන අතිරික්තය = මුළු අයභාරය - TVC (ල. 02)

(iii) a) $Qd = Qs$

$$2000 - 200P = -1000 + 400P$$

$$2000 + 100 = 400P + 200P$$

$$\frac{\cancel{3000}^{5}}{\cancel{600}} = \frac{\cancel{600}P}{\cancel{600}} \qquad 5 = P$$

$$Qd = 2000 - 200P$$
$$= 2000 - 200 \times 5$$
$$= 2000 - 1000 \qquad Q = 1000$$

ස. මිල = 5

ස. ප්‍රමාණය = 1000 (ල. 02)

b) $Edp = -b \times \frac{P}{Qd}$ $\qquad$ $Es = b \times \frac{P}{Qs}$

$$= -\cancel{200}^{1} \times \frac{\cancel{5}^{1}}{\cancel{1000}_{1}} \qquad = -\cancel{400}^{2} \times \frac{5}{\cancel{1000}_{5}} = \frac{10}{5} = 2 \quad (\text{ල. } 01)$$

$$= -1 \quad (\text{ල. } 01)$$

c) ආර්ථික අතිරික්තය = පාරි. අ. + නිෂ්. අ.

$$\text{ආර්ථික අතිරික්තය} = \left(\frac{1}{2} \times (8 - 5) \times 1000\right) + \left(\frac{1}{2} \times (5 - 2.5) \times 1000\right)$$

$$= \left(\frac{3 \times 1000}{2}\right) + \left(\frac{2.5 \times 1000}{2}\right)$$

$$= \left(\frac{3000}{2}\right) + \left(\frac{2500}{2}\right)$$

$$= 1500 + 1250 = 2750$$ (ල. 02)

(iv) Y භාණ්ඩයේ සැපයුම වැඩිවන විට එහි මිල අඩුවේ. Y භාණ්ඩයට අනුපූරකව භාණ්ඩයක් වන X භාණ්ඩයේ ඉල්ලුම වැඩි වේ. මේ නිසා X භාණ්ඩයේ මිල ද ඉහළ යයි. මෙම තත්ත්වය පහත පරිදි රූප සටහනක් මගින් දැක්විය හැක.



(පැහැදිලි කිරීම ල. 02 යි රූප සටහන ල. 02)

04. (i) ● **සහතික මිල ක්‍රමය** :- අවම මිල ආධාරක ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම. ඒ සඳහා අතිරික්ත සැපයුම රජය මිලදී ගැනීම හෝ ඌණ පූර්ණ ගෙවීම සිදු කරනු ලබයි. ● **අවම මිල ප්‍රතිපත්තිය** :- ප්‍රකාශිත මිලට වඩා අඩු මිලකට භාණ්ඩ හුවමාරු කර ගැනීම නීතියට පටහැනි ලෙස සැලකෙන නියෝගයකි. ● **නිෂ්පාදන සලාක ලබා දීම** :- කිසියම් නිශ්චිත කාලයක් තුළ නිපදවිය හැකි නිමැවුම් ප්‍රමාණය පිළිබඳ උපරිම සීමාවන් ආණ්ඩුව විසින් නියම කිරීම. ● **භූමිය වගාවට යොදා නොගැනීමට අනුබල ලබා දීම** :- කෘෂි භාණ්ඩවල අධි සැපයුම් තත්ත්වය වළක්වා ගැනීම සඳහා තමන්ගේ ඉඩමේ වගා කරන බිම් ප්‍රමාණය සීමා කරන ලෙස ගොවීන් වෙත නියම කිරීම හා ඒ වෙනුවෙන් ගේමක් රජය විසින් ගොවීන් වෙත ලබා දීම. ● ස්වාරක්ෂක තොග පවත්වා ගැනීම :- වෙළෙඳපොළ අධි සැපයුම් තත්ත්වයක් හටගෙන මිල පහළ බසින අවස්ථාවක සමුච්චනය කිරීමත් මිල ඉහළ නගින අවස්ථාවක තොග මුදාහැරීමත් මගින් මිල ගණන් වල දැඩි උච්චාවචනය අවම කිරීම. ● අපනයන සඳහා සහනාධාර ලබා දීම. ● වෙළඳපොළ තොරතුරු සපයා දීම. ● ආනයන සීමා කිරීම. ● අතුරු බෝග නිෂ්පාදන කර්මාන්ත ධෛර්යමත් කිරීම. (පැහැදිලි කිරීම සහිත ඕනෑම කරුණකට ල. 02 බැගින් ල. 06 යි.)

(ii) (a) ● උපරිම මිල සීමාවක් යනුවෙන් අදහස් කරනුයේ කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් සඳහා නියම කරන ලද විශේෂිත මිලට වඩා වැඩි මිලකට එම භාණ්ඩ හෝ සේවාව අලෙවි කිරීම නීති විරෝධී ලෙසට සැලකෙන නියෝගයකි. එය කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් සඳහා අලෙවිකරුවන්ට නීත්‍යානුකූලව අයකළ හැකි උපරිම මිල වේ.

(b) (ල. 02)



(නිවැරදි රූපසටහනට ල. 02)

- නිදහස් වෙළඳපොලේ සමතුලිත මිල P_1 වේ. සමතුලිත ප්‍රමාණය Q_1 වේ. එහි දී මුළු ආර්ථික අතිරික්තයේ ප්‍රමාණය PEO ප්‍රදේශයෙන් පෙන්නුම් කරයි. P_2 උපරිම මිල නියම කිරීමෙන් පසු සැපයුම Q_2 දක්වා පහළ වැටේ. ඉල්ලුම Q_3 දක්වා ඉහළ යයි. එවිට $Q_2 - Q_3$ ප්‍රමාණයක භාණ්ඩ හිඟයක් නිර්මාණය වේ.
- Pabo ත්‍රැපීසියමේ ක්ෂේත්‍රඵලය, උපරිම මිලෙන් පසු නිෂ්පාදක අතිරික්තය හා පාරිභෝගික අතිරික්තයෙන් සමන්විත ආර්ථික අතිරික්තය නිරූපණය කරයි. (ල. 02)
- ඒ අනුව උපරිම මිල ප්‍රතිපත්තියෙන් පසුව ආර්ථික අතිරික්තය abE ත්‍රිකෝණයේ ප්‍රමාණයෙන් අහිමි වී යයි. (ල. 02)

(iii)

(අ) රු. 16 දී සැපයුම සෙවීම.

$Qs = -10 + 2 \times 16 = 22$

රු. 16 දී ඉල්ලුම් ප්‍රමාණය

$Qd = 60 - 3 \times 16 = 12$

අධි සැපයුම = රු. 16 දී සැපයුම - රු. 16 දී ඉල්ලුම = 22 - 12 (ල. 01)

= ඒකක 10 (ල. 01)

ආ) පසු පාරිභෝගික අතිරික්තය = $\frac{(\text{උපරිම ඉල්ලුම් මිල - අවම මිල}) \times \text{අවම මිලේ දී ඉල්ලුම් ප්‍රමාණය.}}{2}$

$= \frac{(20 - 16) \times 12}{2}$ (ල. 01)

= රු. 24 (ල. 01)

(iv)

- අතිරික්තය රජය මිලදී ගැනීම
- ඌන පූර්ණ ගෙවීම් ක්‍රමය (ල. 02)

05. (i) (අ) A + B + H + G + F (ල. 02)

(ආ) B + C + H + I (ල. 02)

(ඉ) B + C + E + F + G + H (ල. 02)

(ii) (a)



(නිවැරදි රූප සටහනට ල. 02)

නව සමතුලිත මිල රු. 23

නව සමතුලිත ප්‍රමාණය ඒකක 70 (ල. 02)

(ii) (b) බද්දෙන් පසු අලෙවි ප්‍රමාණය X ඒකක බද්ද = රජයේ බදු අයභාරය

70 x 6 = රු. 42 (ල. 02)

(c) අහිමි වන සමාජ ශුභ සාධනය = $\frac{6 \times 30}{2}$ (ල. 02)

= රු. 45 (ල. 02)

(iii)



(නිවැරදි රූපසටහනට ල. 02)

ආර්ථික අතිරික්තයෙන් වැඩි කොටසක් නිෂ්පාදක අතිරික්තයෙන් සමන්විත වේ. (ල. 02)

06. (i) ● පූර්ණ තරඟය ● ඒකාධිකාරය ● ඒකාධිකාරී තරඟය ● කතිපයාධිකාරය

(එක් කරුණකට 1 බැගින් ල. 04)

(ii) ● නිෂ්පාදනය සුවිශේෂ වීම, ● එක් ආයතනයක් පමණක් නිෂ්පාදනයේ නිරත වීම. ● ප්‍රවේශයට බාධා පැවැතීම. ● වෙළඳපොල තොරතුරු අපූර්ණ වීම හා පිරිවැයකින් තොරව ලබා ගත නොහැකි වීම.

(කරුණකට 01 බැගින් ල. 04)

(iii) ● ආපන ශාලා - ඒකාධිකාරි තරඟය. ● බාබර් සාප්පු - ඒකාධිකාරි තරඟය. ● දුම්රිය සේවා - ඒකාධිකාරය. ● රූපවාහිනී සේවා - කතිපයාධිකාරය. ● වී සහ බඩ ඉරිඟු - පූර්ණ තරඟය.

(ල. 01 බැගින් ල. 05)

(iv) අ) සාමාන්‍ය නිෂ්පාදිතය යනු:- ● විචල්‍ය යෙදවුම් ඒකකයකට සාමාන්‍ය වශයෙන් ලැබෙන නිමවුම් ප්‍රමාණය යි. ● සාමාන්‍ය නිෂ්පාදිතය ගණන් බලනුයේ කිසියම් විචල්‍ය යෙදවුම් ප්‍රමාණයකදී ලැබෙන මුළු නිෂ්පාදිතයේ ප්‍රමාණය අදාළ විචල්‍යය යෙදවුම් ඒකක ප්‍රමාණයෙන් බෙදීමෙනි.

● උදාහරණ :- විචල්‍ය යෙදවුම් ඒකක 5 ක් භාවිතා කරන විට මුළු නිෂ්පාදිතය ඒකක 40 වේ. එවිට විචල්‍ය යෙදවුමක සාමාන්‍ය නිෂ්පාදිතය. 40÷ 5 = 8 වේ. (ල. 02)

සාමාන්‍ය පිරිවැය යනු :- ● නිමවුම් එක් ඒකකයකට අදාළ පිරිවැයයි. ● නැතහොත් භාණ්ඩ එක් ඒකකයක් නිපදවීමේ පිරිවැයයි.

$$\text{සාමාන්‍ය පිරිවැය} = \frac{\text{මුළු පිරිවැය}}{\text{නිමවුම් ඒකක සංඛ්‍යාව}}$$ (ල. 02)

ආ) ● ආන්තික නිෂ්පාදිතය යනු :- ● විචල්‍ය යෙදවුම් එක ඒකකයකින් වෙනස් කරනු ලැබුවහොත් මුළු නිෂ්පාදිතයේ හටගන්නා වෙනස් වීමයි. ● නැතහොත් නිමවුමට එකතුවන ප්‍රමාණය යි.

$$\text{ආන්තික නිෂ්පාදිතය} = \frac{\text{නිෂ්පාදිතයේ වෙනස}}{\text{මුළු යෙදවුම්වල වෙනස}} \qquad MP = \frac{\Delta TP}{\Delta L}$$ (ල. 02)

● ආන්තික පිරිවැය යනු :- ● නිමවුම් එක් ඒකකයකින් වැඩි කරන විට මුළු පිරිවැයට එකතුවන ප්‍රමාණය යි.

$$MC = \frac{\Delta TC}{\Delta Q}$$ (ල. 01)

07. (i) අ) නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදවුම් හා නිමවුම් අතර පවත්නා තාක්ෂණික සම්බන්ධතාව නිෂ්පාදන ශ්‍රිතය නම් වේ.

එය $Q = f(L, K)$ ලෙස දැක්විය හැක. (ල. 02)

ආ) ● නිෂ්පාදන ක්‍රියාවලියේ දී නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ඇතැම් යෙදවුම් (අවම වශයෙන් එක් සාධකයක් වත්) වෙනස් කළ නොහැකි කාල පරිච්ඡේදය කෙටි කාලය නම් වේ. (ල. 01)

● දිගු කාලය යනු:- සියලු යෙදවුම් වෙනස් කරමින් නිමැවුම වෙනස් කළ හැකි කාලය යි. (ල. 01)

කෙටි කාලය	දිගු කාලය
● කෙටි කාලයේ දී ස්ථාවර හා විචල්‍ය යෙදවුම් දෙවර්ගයම පවතී.	● දිගු කාලයේ දී සියළු යෙදවුම් විචල්‍ය යෙදවුම් වලින් පමණක් සමන්විත වේ.
● කෙටි කාලයේ දී හීනවන ආන්තික ඵලදා නීතිය ක්‍රියාත්මක වේ.	● දිගු කාලයේ දී පරිමාණානුකූල තල නීතිය ක්‍රියාත්මක වේ.

(සැසඳෙන කරුණකට ල. 02 බැගින් ල. 04)

(ii)

ලක්ෂණය	පූර්ණ තරගය	ඒකාධිකාරී තරගය
1. ආයතන සංඛ්‍යාව	අති විශාල වේ.	විශාල වේ.
2. නිපදවන භාණ්ඩ වල ස්වරූපය.	සමජාතීය භාණ්ඩ වේ. උදා: වී, කැරට්	ප්‍රභේදික භාණ්ඩ වේ. උදා: ආපනශාලා
3. පිවිසුම හා පිටවුම	අබාධ ප්‍රවේශය හා පිටවුම	අබාධයි.
4. මිල තීරණය	මිල ගණුවෙකි. පැවරුණු මිලක් අනුව ආයතනය කටයුතු කරයි. $P = MC$	මිල තීරකයෙකි. $P > MC$
5. ඉල්ලුම් වක්‍රය	ආයතනයක ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය වේ.	පහළට බෑවුම් වන ඉල්ලුම් වක්‍රයකි.

(සැසඳෙන කරුණකට ල. 02 බැගින් මුළු ල. 05)

(iii) අ) 1. ප්‍රධාන අමුද්‍රව්‍ය පිළිබඳ හිමිකම, 2. රජයේ නීතිමය බාධක, 3. පරිමාණානුකූල පිරිමැසුම් ඇතිවීම.

(ල. 03)

ආ) ● ආර්ථික බදුකුළිය යනු:- කිසියම් නිෂ්පාදන සාධකයක් පවත්නා භාවිතයෙහි රඳවා තබා ගැනීම සඳහා එම සාධකය අපේක්ෂා කරන අවම ගෙවීම ඉක්මවා ආදායමක් උපයා ගන්නේ නම් එම අතිරික්ත ආදායමයි.

(ල. 01)

● සංක්‍රාම ඉපයීම :- කිසියම් නිෂ්පාදන සාධකයක් පවත්නා භාවිතයෙහි රඳවා තබා ගැනීම සඳහා එම සාධකය අපේක්ෂා කරන අවම මිල සංක්‍රාම ඉපයීම වේ. (ල. 01)

● නම්‍ය සාධක සැපයුම් අවස්ථාවක දී සාධක ඉපැයුම්

නම්‍ය සාධක සැපයුම් අවස්ථාවක දී සාධක ඉපයුම



$NPIE$ = ආර්ථික බදුකුළී

$ONEQ_1$ = සංක්‍රාම ඉපයීම.

(ල. 01)

● අනම්‍ය සාධක සැපයුම් අවස්ථාවකදී සාධක ඉපැයුම්



OPIE = ආර්ථික බදුකුළී

QEQ_1 = සංක්‍රාම ඉපයීම.

(ල. 01)

08. (i) ඇතුළත් කරන — ඇතුළත් නොකරන

(අ), (ඇ), (ඉ) — (ආ) (ල. 04)

(ii) ප්‍රාථමික යෙදවුම් සහ අතරමැදි යෙදවුම් ලෙස නිෂ්පාදන ක්‍රියාවලියේ දී යොදාගන්නා යෙදවුම් වර්ග දෙකකි.

● නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා පිටතින් මිලදී ගනු ලබන භාණ්ඩ හා සේවා අතරමැදි යෙදවුම් ලෙස හැඳින්වේ.

● මේවා නිෂ්පාදනය කරන ලද යෙදවුම් ය. ● මේවා නිෂ්පාදන ක්‍රියාවලියට යොදාගත් විට ක්‍රියාවලිය තුලම අවසන් වේ. උදා:- පොහොර, අමුද්‍රව්‍ය, ජලය, විදුලිය, ලිපිද්‍රව්‍ය

● නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගැනෙන නිෂ්පාදන ක්‍රියාවලිය තුළ අතුරුදන් වී නොයන යෙදවුම් ප්‍රාථමික යෙදවුම් ලෙස හැඳින්වේ. ● ප්‍රාථමික යෙදවුම්වලට නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා නැවත නැවතත් සහභාගී වීමේ හැකියාව පවතී. උදා:- ශ්‍රමය, භූමිය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය.

(පැහැදිලි කිරීම්වලට ල. 01 බැගින් උදා: දැක්වීමට ල. 01 බැගින් උපරිම ල. 04)

(iii) අ) මූලික මිලට දළ එකතු කළ අගය. සේවක ආදායම් + දළ මෙහෙයුම් අතිරික්තය + වෙනත් ශුද්ධ බදු(ල. 01)

$$4500 + 9000 + 100 = 13600$$ (ල. 01)

ආ) දළ දේශීය නිෂ්පාදිතය

මූලික මිලට එකතු කළ අගය + නිෂ්පාදිතය මත ශුද්ධ බදු (ල. 01)

$13600 + 1600 = 15200$ (ල. 01)

ඉ) ශුද්ධ ජාතික ආදායම.

(දළ දේශීය නිෂ්පාදිතය - ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය) + විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම් (ල. 01)

$(15200 - 200) + (-600) = 14400$ (ල. 01)

(iv) අ) සමතුලිත ජාතික ආදායම.

(iv) (අ)

$Y = C + I$

$Y = 0.8\ Y + 400$

$Y - 0.8\ Y = 400$ (ල. 01)

$0.2\ Y = 400$

$Y = \frac{400}{0.2}$

$\underline{\underline{Y = 2000}}$ (ල. 01)

ආ)

$S = I,\ S = 0.2\ Y$

$0.2\ Y = 400$

$0.2 \times 2000 = 400$

$400 = 400$

$S = I$ (ල. 01)

ඇ)

$C = 200 + 0.8\ Y$ වූ විට

$Y = C + I$

$Y = 200 + 0.8Y + 400$ (ල. 01)

$Y = 600 + 0.8\ Y$

$Y - 0.8Y = 600$

$Y = \frac{600}{0.2} = \underline{\underline{3000}}$ (ල. 01)

09. (i) • මූල්‍ය නොවන සමාගමික අංශය. • මූල්‍ය සමාගමික අංශය. • රජය. • කුටුම්බ. • කුටුම්බ සඳහා සේවය සපයන ලාභ අපේක්ෂාවක් නොමැති ආයතන. (ආයතන 5 ට දැක්වීමට ල. 04)

(ii) • දළ දේශීය නිෂ්පාදිතය ලෙස සැලකෙන්නේ දෙන ලද කාල පරිච්ඡේදයක දී කිසියම් රටක ආර්ථික ප්‍රදේශය තුළ සිටින සියලුම නේවාසික ආයතනික ඒකක විසින් බිහි කරන ලද සමස්ත එකතු කළ අගයයි.(ල. 02)

• දළ ජාතික ආදායම යනු අදාළ රටේ ආර්ථික ප්‍රදේශය තුළ සිදුවන නිෂ්පාදනයේ එකතු කළ අගය පමණක් නොව සලකා බලන වර්ෂය තුළ එම රටේ නේවාසික ආයතනික ඒකකයන්ට හිමිවන සමස්ත ආදායමේ ප්‍රමාණයයි.

දළ දේශීය නිෂ්පාදන + ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම් = දළ ජාතික ආදායම. (ල. 02)

(iii) අ) මිලට එකතු කළ අගය

කෘෂි අංශයේ එකතු කළ අගය	1 800	
කර්මාන්ත අංශයේ එකතු කළ අගය	2 000	
සේවා අංශයේ එකතු කළ අගය	2 500	
මූලික මිලට එකතු කළ අගය	6 300	(ල. 01)

ආ) වෙළඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදනය

මූලික මිලට එකතු කළ අගය	6 300	
වෙළඳ ආන්තිකය	100	
ශුද්ධ බදු	200	
	6 600	(ල. 02)

ඇ) දළ ජාතික ආදායම

දළ දේශීය නිෂ්පාදිතය + (විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම් ලැබීම් - විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම් ගෙවීම්)

6 600 + (600 - 700)

6 600 + (-100) = 6 500 (ල. 02)

(iv) (අ) ආන්තික පරිභෝජන නැඹියාව.

$$MPC = \frac{\Delta C}{\Delta Y} = \frac{30}{50} = \frac{3}{5} = 0.6$$ (ල. 01)

ආ) පරිභෝජන ශ්‍රිතය

$C = 100 + 0.6Y$ (ල. 01)

$S = -100 + 0.4Y$ (ල. 01)

(v) වැයකළ ආදායමේ වෙනසක් : (ΔY) ඇතිවුවහොත් එහි ප්‍රතිඵලයක් වශයෙන් පරිභෝජන වියදමේ හට ගන්නා වෙනස (ΔC) අනුපාතයක් හෝ ප්‍රතිශතයක් හෝ වශයෙන් දැක්වීම. ආන්තික පරිභෝජන නැඹියාවයි.

ආන්තික පරිභෝජන නැඹියාව = $\frac{\Delta C}{\Delta Yd}$ (ල. 01)

මුළු වැයකළ හැකි ආදායමින් පරිභෝජනය සඳහා වැය කරනු ලබන මුදල් ප්‍රමාණයේ අනුපාතය සාමාන්‍ය පරිභෝජන නැඹියාවයි. (ල. 01)

සාමාන්‍ය පරිභෝජන නැඹියාව = $\frac{C}{Yd}$ $\frac{\text{පරිභෝජන වියදම්}}{\text{වැය කළ හැකි ආදායම්}}$ (ල. 01)

10. (i) පෞද්ගලික ව්‍යාපාරික අංශය ලබා ගන්නා ණය සඳහා ගෙවනු ලබන පොලිය ආදායමක් වශයෙන් සලකා ජාතික ගිණුම් තුලට ඇතුළත් කරනු ලබන නමුත්, රජය විසින් ලබා ගන්නා ණය සඳහා ගෙවනු ලබන පොලිය ආදායමක් වශයෙන් නොසැලකෙන අතර එය ජාතික ගිණුම් තුළට ඇතුළත් නොවේ. (ල. 01)

රාජ්‍ය ණය සලකනු ලබන්නේ ඵලදායි නිෂ්පාදන ක්‍රියාවක් සඳහා යොදා ගනු ලබන ප්‍රාග්ධන අරමුදලක් වශයෙන් නොව විශ්‍රාම වැටුප්, ආරක්ෂක වියදම් වැනි වර්තන වියදම් පියවා ගැනීමට යොදා ගැනෙන අරමුදල් වශයෙනි. එබැවින් රාජ්‍ය ණය සඳහා ගෙවනු ලබන පොලිය කිසියම් ඵලදායි නිෂ්පාදන ක්‍රියාවක් ඇසුරෙන් බිහි වන ආදායමක් නොව රජයේ බදු ආදායම් වලින් පියවිය යුතු සංක්‍රාම වියදම් විශේෂයෙක් ලෙස සලකනු ලැබේ. (ල. 02)

(ii) කිසියම් වර්ෂයක් සඳහා ස්ථාවර මිල යටතේ ගණනය කරන ලද නිෂ්පාදිතයේ වටිනාකම සහ එම වර්ෂයේම පවත්නා මිල යටතේ ගණනය කරන ලද නිෂ්පාදිතයේ වටිනාකම සංසන්දනය කිරීම මගින් පාද වර්ෂයට සාපේක්ෂව එම වර්ෂයේ දී මිල මට්ටම කොපමණ ප්‍රමාණයකින් වෙ වී තිබේ දැයි දැන ගැනීමට භාවිතා කරන මිනුමකි. එය ගණනය කරනු ලබන්නේ, (ල. 02)

$$\text{දළ දේශීය නිෂ්පාදිතය අවධමනකය} = \frac{\text{පවත්නා මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය}}{\text{ස්ථාවර මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය}} \times 100$$ (ල. 01)

(iii) පෞද්ගලික පරිභෝජන වියදම් (C) රජයේ වියදම් (G) දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය (I)
ශුද්ධ අපනයන (X - M) (ල. 04)

(iv) අ) සමතුලිත ජාතික ආදායම.

$C = 50 + 0.75\,yd$

$I = 500,\ G = 400\ \ T = 400$

$Y = C + I + G$

$Y = 50 + 0.75\,yd + 500 + 400$ (ල. 01)

$Y = 50 + 0.75\,(Y - T) + 900$

$Y = 50 + 0.75\,(Y - 400) + 900$

$Y = 950 + 0.75Y - 300$

$Y = 650 + 0.75Y$

$Y - 0.75Y = 650$

$0.25Y = 650$

$Y = \frac{650}{0.25} = 2600$ (ල. 01)

ආ) අවධමනාත්මක පරතරයකි. (ල. 01)

විභව නිමැවුම	=	3600
සමතුලිත නිමැවුම (පවතින නිමැවුම)	=	2 600
අවධමනය පරතරය		1000

(v) දළ දේශීය නිෂ්පාදිතය සමතුලිතය නීර්ණය වීම.

සමාහාර වියදම් ප්‍රවේශය.



විදීම් කාන්දුවීම් ප්‍රවේශය.



(සියළුම සංරචක ඇතුලත් කෙට අඳින ලද ප්‍රස්ථාරයකට ල. 03 බැගින් ලබා දිය යුතුයි)